# යහපත් රාජ්‍ය පාලන සංවිධානයක් ගොඩනැඟීම සඳහා බෞද්ධාගමික ඉගැන්වීම් මෙරට පාලකයන් යොදාගත් ආකාරය කවරාකාර වී ද? යන්න ශිලා ලේඛන මූලාශ්‍රය ඇසුරෙන් කරනු ලබන විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආර්.එම්.ජී. වසන්ත දිසානායක[1], විල්ගමුවේ පියනන්ද හිමි[2]
ඩබ්.එම්.ඩී. ඉන්දිකා පියදර්ශනී සෝමරත්න[3]

## හැඳින්වීම

ඕනෑම රාජ්‍යයක සමස්ත පුරවැසියන්ගේ අපේක්ෂාව වනුයේ ආරක්ෂිත දේශයක් හා සුරක්ෂිත ජීවන පැවැත්මකි. එවැනි තත්ත්වයක් පුරවැසියන්ට ළඟාකරගත හැකි වනුයේ යහපත් ධර්මතා ක්‍රියාවට නංවන පාලන ක්‍රමවේදයකිනි. බුදුදහම විසින් නිර්දේශිත පාලන ක්‍රමවේද හා ධර්මතා පාලකයා විසින් නිවැරදි ව ක්‍රියාවට නංවන්නේ නම් පුරවැසියන් අපේක්ෂිත යහපත් රාජ්‍යය හා ජීවිතය ළඟා කරගැනීමට අපහසු නොවන බව භාරතයේ මෙන් ම පැරණි ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රයන් පිරික්සීමේදී ද පෙනී යන කරුණකි. මහින්දාගමනයත් සමඟ මෙරට පාලක පන්තිය බෞද්ධ දර්ශනය මත පදනම්ව තම පාලන තන්ත්‍රය සකසා ගැනීමට උත්සුක වූ බව මහාවංසය, දීපවංසය වැනි සාහිත්‍ය මූලාශ්‍රය තුළ අන්තර්ගත කරුණුවලින් පෙනී යයි. එම සාහිත්‍ය මූලාශ්‍රයට අමතර ව පැරණි ශ්‍රී ලංකාවේ පාලකයන් (රජරට ශිෂ්ටාචාරය කේන්ද්‍රගතව සිටි) බෞද්ධ පාලන මූලධර්ම හා එම ඉගැන්වීම්වල ආභාසය මතින් තම පාලන සංවිධානය සකස් කරගත් ආකාරය ඔවුන්ට වඩාත් සමකාලීන මූලාශ්‍රයක් වන ශිලා ලේඛන තුළ එන සටහන්වලින් තහවුරු කරගත හැකි ය.

## පර්යේෂණ ගැටලුව

රජරට ශිෂ්ටාචාර අවධියට අයත් (අනුරාධපුර හා පොලොන්නරු අවධීන්) ශිලා ලේඛන මූලාශ්‍රයවල සඳහන් බෞද්ධ පාලන මූලධර්මවලට අනුව මෙරට පාලකයන් සිය පාලන තන්ත්‍රය ගොඩනැඟීමට කටයුතු කර තිබේ ද යන ගැටලුව මත පදනම්ව මෙම පර්යේෂණය සිදු කෙරේ.

## පර්යේෂණ අරමුණු

බෞද්ධ පාලන මූලධර්ම ශිලා ලේඛන මූලාශ්‍රයවල අන්තර්ගත ව ඇති ආකාරය හඳුනාගැනීම සහ එම මූලධර්ම මෙරට පාලකයන් පාලන සංවිධානයේ දී යොදාගත් ආකාරය විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණු ය.

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
wasanthad@kln.ac.lk
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.
wilpiyananda@busl.ac.lk
3. දර්ශනශූරී උපාධි අපේක්ෂක, indikasomaratne@gmail.com

**පර්යේෂණ ක්‍රමවේදය**

බුදුන්වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍ර ධර්ම අතුරින් රාජ්‍ය පාලනය පිළිබඳ මූලධර්ම 'චක්කවත්ති සීහනාද, අග්ගඤ්ඤ, කූටදන්ත, මහාසුදස්සන, රජ්ජ හා මහාපරිනිබ්බාන' වැනි සූත්‍රයන්හි අන්තර්ගත ව තිබේ. එම සූත්‍රවල සඳහන් ව ඇති තොරතුරුවලට අනුව පරමාදර්ශී රාජ්‍ය පාලකයා පාලන ක්‍රියාවලියේ දී දශ රාජධර්ම ද සතර සංග්‍රහ වස්තු ද සක්විති වත් හා සප්ත අපරිහානීය ධර්ම පාදක කර ගනී. රාජධර්මයන්ට ගරු කොට, ධර්මය ම ගුරු කොට, මෘග පක්ෂීන්ට පවා දැහැමි වූ රක්ෂාවරණය සලස්වා, සිය අණසක පැතිරවීම ධාර්මික පාලකයා අතින් අපේක්ෂිත පාලන ක්‍රමවේද යයි. මෙම පාලන ක්‍රමවේද හා සංකල්ප හතරවන මිහිඳු, පළමු විජයබාහු, පළමු පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල, ලීලාවති රැජින වැනි පාලක පාලිකාවන් විසින් පිහිටු වන ලද ශිලා ලේඛන රැසකම සඳහන් ව ඇත. ඉහත සඳහන් කළ සාහිත්‍ය හා පුරාවිද්‍යා යන මූලාශ්‍රයද්වයේ ම එන කරුණු ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුගත වෙමින් විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්‍රමවේදය යි.

**සාකච්ඡාව**

පාලකයා ධාර්මික නොවේ නම් ජනතාව ද අධාර්මිකව දූෂිතයන් බවට පත්වෙති. එබැවින් පාලකයා ධාර්මික විය යුතු ය යන්න බෞද්ධ ආගමික සම්ප්‍රදායයේ පිළිගැනීමයි. ධාර්මික වීම යනු විශ්ව සාධාරණ නීති පද්ධතියකට අනුගත ව පුද්ගලයාත්, සමාජයත්, සත්ත්ව ප්‍රජාවත් සැකසීම යි. 'ධර්ම චර්යාව' යන්නෙන් අදහස් කරන්නේ විශ්ව සාධාරණ ප්‍රතිපත්තියක් මත පිහිටා හැසිරීම යි. ක්‍රි.පූ. තෙවන සියවසේ සිදු වූ මහින්දාගමනයත් සමඟ මෙරට දේශපාලන අධිකාරිත්වය බෞද්ධ පාලන ධර්ම චර්යාව මත පදනම්ව පාලන සංවිධානය ගොඩනගා ගැනීමට උත්සුක වූ බවක් පෙනී යනුයේ එළාර, සේන - ගුත්තික, බුද්දපාරින්ද වැනි දකුණු ඉන්දියාවේ සිට මෙහි පැමිණ රජ වූ අය ද බුදුදහමට වඩාත් සමීව පාලන තන්ත්‍රයක් ගොඩනැගීමට කටයුතු කර ඇති බැවිනි. ''රජ්ජං ධමේමන කාරයුං'' (උෆ.පූ.ස.මහාවංසො, 1929, පරි. 21. ගා. 11) ''රාජා ධම්මම්හි වතතනෙතා'' (උෆ.පූ.ස.මහාවංසො, 1929, පරි. 21. ගා. 29) යන වංසකථා විස්තරයන්ගෙන් සේන ගුත්තික හා එළාර යන පාලකයන් ධර්මය මත පදනම්ව සිය පාලන කටයුතු ගෙන ගිය බවට කරුණු තහවුරු කරගත හැකි ය.

දේවානම්පියතිස්ස රජ දවසේ සිට ම ''ශ්‍රී ලාංකික පාලකයා බෞද්ධයකු විය යුතු ය'' යන්න ජනතා විශ්වාසය බවට පත්ව තිබුණි. එම තත්ත්වය අනුරාධපුර රාජධානි සමයේ අවසන් භාගය වන විට දේශපාලන අධිකාරිත්වයට කොතරම් බලපා තිබේ ද යන්න ''ල(ක්හි) නො බොසත්හු නො රජ්වන්හයි සැහැකුල කොත් .... සවැනිය මුනිරජ්හු ..... (වියාරණ්) ලද් තමා ....'' (E.Z.Vol.I. 1912, p.234) බෝධිසත්ත්වයකු නොවන කෙනකු මෙම රාජ්‍යයෙහි රජකු නොවිය යුතු ය. බුදුන්වහන්සේ විසින් ද ඒ සඳහා විවරණ ලබා දී ඇතැයි යන සිව්වන මිහිඳු රජුගේ ප්‍රකාශනයකින් පැහැදිලි කරගත හැකි ය. මෙම අදහස් තවදුරටත් ඉදිරියට ගෙන යන නිශ්ශංකමල්ල රජු පොළොන්නරුවේ උතුරු වාසල් දොරටු ලිපියේ දී ''බුදුසසුනට හිමි ලක්දිවට අබෞඨ චොළ කෙරළාදි රජදරුවොද නොතැකියැ යුතතාහ උන් හා එක්වැ පෙරළිකළාහු රාජද්‍රො(හි)නම් වෙති.'' (EZ.Vol.II.p.159) යනුවෙන් ද, ගල්පොත ශිලා ලේඛනයේ දී ''කාලිඟවශයට හිමි

ලක්දිවැ බුධශාසනයට ප්‍රතිපක්ෂ අබෞඪ චොඩ පාඬ්‍යාදි රජුන් නොපිහිටිවියැ යුත්තේයැ විජයරාජකුමාරයන් කෙරෙ පටන් ලක්දිව හිමි කාලිඞ්ගවශයෙහි ...'' ːEZ.Vol.II.p.109) යනාදි වශයෙන් මෙරට පාලනය හිමිවන්නේ බෞද්ධයන්ට පමණක් යැයි අවධාරණය කර තිබේ. බෞද්ධ අදහස් වඩාත් ඉස්මතු වන ලෙස රාජ්‍ය පාලනය ක්‍රියාවට නැංවීමට උත්සාහ කළ නිශ්ශංකමල්ල රජු රජවරුන් ලෝකයේ දෙමව්පියන් ලෙස පෙනී සිටිය යුතු බවත්, (E.Z.Vol.II.pp.158,169)''... (මැඳහත්) රජුන් ලැබීම බුදුන් ලැබීම්සේ සැලකිය යුතුයැ'' (E.Z.Vol.II.p.108) ආදි වශයෙන් සිය ශිලා ලිපිවල සඳහන් කර ඇත. මෙයින් කියැවෙනුයේ තමන්ගේ මධ්‍යස්ථ බව බුදුන්වහන්සේ කෙනෙක් ලැබුවා හා සමාන යැයි පෙන්වා දීමයි.

බුදුසමය 'දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපෝගුණය, මෛත්‍රිය, අවිහිංසාව, ඉවසීම හා විරුද්ධවාදි නොවීම' ආදි වශයෙන් රාජධර්ම දහයක් නිර්දේශ කර තිබේ. මෙම දශ රාජධර්ම ප්‍රගුණ කරන නායකයා සමාජයක ආර්ථික, සාමාජික, දේශපාලනික හා ආගමික අවශ්‍යතා සර්ව සාධාරණ ලෙස ඉටු කරන බැවින් එම පාලන තන්ත්‍රය තුළ පරාර්ථ චර්යාව කුළුගන්වනු ඇත. මෙම ධර්මතාවන්ගෙන් පෝෂණය ලබන පාලකයා, දෙමාපියන් සිය එක ම දරුවාට දක්වන ළෙන්ගතුකම හා සමාන ව සිය රටවැසියා කෙරෙහි ද ආදරය දක්වයි. ප්‍රජාව ආරක්ෂා කරයි. ඉදින් පාලකයා මේ ආකාරයෙන් ධාර්මික වූ කල රටවැසියෝ ද ධාර්මික වෙති. ධාර්මික පාලනයක් ගොඩනැගීමේ දී රජතුමා 'දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව' යන සිවු සඟරාවතින් ද පෝෂණය විය යුතු ය. රටවැසියාගේ ශ්‍රමයෙන් රට ස්වයංපෝෂිත කිරීම සඳහා සෑම රාෂ්ට්‍ර පාලකයකුම සියලු පුරවැසියන්ට සේවා නියුක්තීන් සපයා දිය යුතු බව 'කූටදන්ත' සූත්‍රයේ දී අවධාරණය කර තිබේ.

ත්‍රිපිටක සාහිත්‍යයේ එන ඉහත සඳහන් කළ ඉගැන්වීම් අනුරාධපුර රාජධානියේ අවසාන භාගයේ දී මෙන් ම විශේෂයෙන් ම පොළොන්නරු රාජධානි සමයේ රාජත්වයට පත් පාලකයන් කිහිප දෙනකු විසින්ම පාලන තන්ත්‍රයට යොදා ගැනීමට අවධානය යොමු කළ බවත්, ඔවුන් එම ධර්මතාවන්ට අනුකූල ව පාලනය ගොඩනැගූ බවත් ඔවුන් විසින් පිහිටුවා ඇති ශිල ලේඛන තුළ සඳහන් කර තිබේ. හතරවන මිහිඳු රජතුමා වෙස්සගිරි පුවරු ලිපියේ දී ''දසරදදම් සතර සඟ්වත් නො ඉක්මැ'' (EZ.Vol.I.p.31) යනුවෙන් ද පළමු වන විජයබාහු රජතුමාගේ පොළොන්නරු ලිපියේ දී ''...දශරාජධමමී නොකොපො ..... සිරිසඟබො විජයබාහු දෙවයන් ....'' යනුවෙන් ද (EZ.Vol.IV.p.71) නිශ්ශංකමල්ල රජු රන්කොත් දාගැබ ගල් ආසන ලිපියේ දී ''...ලක්දිව වැඩැ දශරාජධමමීයෙන් රාජ්‍ය කෙරෙමින්'' යනුවෙන් ද (EZ.Vol.II.p.135) ලීලාවතී රැජිනට අයත් අනුරාධපුර ශිලා ලේඛනයේ දී (මාර්කේඩ්) ''අභා සලමෙවන් ලීලාවතී ..... ධැමින් සෙමින් දස රාජ ධමමී යෙන් රජ කරන සෙයෙක්'' (EZ.Vol.I.p.179) යනුවෙන් තමන්ගේ පාලනය දශ රාජ ධර්මයන්ට අනුකූලව ගොඩනගන ලද්දේ යැයි පවසා තිබේ. පළමු වැනි විජයබාහු රජු සියලු දෙනාට සෙත සලසමින් ලෝකාර්ථ චර්යාවෙහි යෙදුණු බව ඔහුට අයත් අඹගමුව සෙල්ලිපියෙහි ''තුනුරුවනට පුද, ඇජරනට උවටැන්, යුත්තන්ට ගැවුරු, වියත්නට සසිරි, සියනට නුගුරා, මිතුරනට වී වම් ..... සතුරනට දපැ, සව්සතුනට කුලුණුවත්, සබවට නුවණ, කුමඟට එකත් සරු කළ.....'' (E.Z.Vol.II.p.211) යනාදී වශයෙන් එන සඳහනින් පැහැදිලි කරගත හැකි ය. ඉහත සඳහන් කළ සියලු කරුණුවලින් පැහැදිලි වනුයේ දශරාජ ධර්මයන්ට අනුකූල ව මෙරට ඇතැම් පාලකයන් රාජ්‍ය පාලනය කිරීමට උත්සාහ ගෙන ඇති බව ය.

මෙරට පාලකයා හා පාලන ක්‍රියාවලිය ධාර්මික විය යුතු ය යන මතවාදය පොදුවේ පිළිගැනීමට ලක්වූවකි. අතීත ශ්‍රී ලාංකිකයෝ බෞද්ධ රාජ්‍ය සංකල්පය අවිවාදයෙන් පිළිගත්හ. එසේ ම ''මේ දිවයින සම්බුදු සසුනට පූජා කරන ලද්දකි''යි යන විශ්වාසය ද විය. මේ නිසාම ඇතැම් රජවරු ලක්දිව වරින් වර සසුනට පූජා කළහ. ''...ලක්දිව්හි මේ රජය පස් වරක් සසුන් විසයෙහි දුන්නෙමි.'' දුටුගැමුණු රජ සසුනට මේ ලක්දිව පිදූ බව වංසකථාවේ සඳහන් ව ඇති ආකාරය යි. (මහාවංශය, පළමු කාණ්ඩය, 2014,පරි.32.ගා.39) මීට අමතර ව (මහාවංශයේ දෙවන කොටසේ පරි.42.ගා.61., පරි.49.ගා.49., පරි.63.ගා.64) යන තන්හි ද පාලකයන් විසින් මෙරට බුදුසසුනට පූජා කළ ආකාරය සඳහන් කොට ඇත. මෙයින් හැඟී යනුයේ රටේ පාලකයා බෞද්ධයකු විය යුතු ය. පාලනය ධාර්මික විය යුතු ය යන්නයි.

මහාංවශයේ සඳහන් වන ආකාරයට බුද්ධදාස රජතුමා 'දශ රාජ ධර්ම, දශ පාරමිත, සතර සංග්‍රහ වස්තු හා දශ පුණ්‍ය ක්‍රියා' යන බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කර තිබේ. (මහාවංශය, දෙවන කාණ්ඩය, 2014, පරි. 37. ගාථා. 130, 131) ''තෙනහි ත්‍වං තාත ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං මානෙන්තො ධම්මං පූජෙන්තො ධම්මං අපචායමානො....'' (දීඝනිකාය, තෙවන කොටස, 1976, පි. 100) ධර්මය ම ඇසුරු කොට, ධර්මයට සත්කාර කරමින්, ධර්මයට ගරු කරමින්, ධර්මයට පුදමින්, ධර්මය ම පිළිසරණ කරමින් රාජ්‍යය පාලනය කළ යුතු යැයි චක්කවත්තිසීහනාද සූත්‍රයේ එන ඉගැන්වීම් සිරි සංඝබෝධි චරිතය විසින් ක්‍රියාවට නැංවූ බව හත්ථවනගල්ලවිහාරවංශයේ එන විස්තරයන්ගෙන් ප්‍රකට වෙයි. (හත්‍ථවනගල්ලවිහාරවංශය, සංස්. ඒ. ඇම්. ඩී. වයි. සරත්චන්ද්‍ර අමරතුංග, 2001, පිටු.17,18).

මෙරට පාලකයන් දානය, සීලය, පරිත්‍යාගය, සමානාත්මතාවය යන සතර සංග්‍රහ වස්තු විෂයෙහි ද විශේෂ අවධානයක් යොමු කළ බව ශිලා ලේඛනවල එන තොරතුරුවලින් පැහැදිලි කරගත හැකි ය. සාමාන්‍ය දානමය පිංකම්වලට අමතර ව නිශ්ශංකමල්ල රජු තුලාභාර දාන ගණනාවක් පැවැත් වූ බවට තොරතුරු හමුවන අතර එක් අවස්ථාවක එය සිදු කළ ආකාරය ශ්‍රී නිශ්ශංකමල්ල ගල් ආසන ශිලා ලේඛනය ඇසුරෙන් මෙසේ පෙන්වාදිය හැකි ය ''තුලාභාර නැගෙමි සිතා වදාරා ... තමන්වහන්සේ හා තුන්දෙනා වහන්සේ තුලාභාර නැඟී සත්රුවන් හා ඇතුළු රිදී තිරම් හා අනන්ත කොට ... මහාදාන වෂීා පවත්වා'' (E.Z.Vol.II, p.107) යනුවෙනි.

රටවැසියාට නිෂ්පාදන ක්‍රියාවලියෙහි නියැළීම සඳහා ප්‍රාග්ධනය ලබාදීම බෞද්ධ න්‍යාය යි. ගොවිතැනට අවශ්‍ය බිත්තර වී (බීජ භත්තං) හා සෙසු අවශ්‍යතා රජය විසින් සැපයිය යුතුව තිබේ. අතීත රජවරු වැව් බැඳ ඇළ මාර්ග මගින් ජනතාවට ජලය ලබා දුන්හ. රාජ්‍ය සේවකයන්ටත්, හමුදා සේවකයන්ටත් නියමිත වැටුප් ගෙවීමට මෙරට පාලකයෝ වගබලා ගත්හ. රජවරු සිය සේවකයන්ට වැටුප්, ගම්වර, ඉඩ කඩම් ප්‍රදානය කළහ. පාලකයා විසින් පාලිතයා පෑගීමක්, ඔහුගේ ශ්‍රමය සූරා කෑමක්, අයථා කාර්යයන්හී යෙදවීමක් බුදුසමය අනුමත නොකරයි. නිරතුරුව පාලකයා හා පාලිතයා අතර අන්‍යෝන්‍ය අවබෝධය, ගෞරවය හා සුහදතාව අවධාරණය කරයි. මෙරට බොහෝ පාලකයන් මෙම ගුණය ආරක්ෂා කිරීමට කටයුතු කළ බවට සාධක සාහිත්‍ය මූලාශ්‍රයනගෙන් මෙන් ම පුරාවිද්‍යා මූලාශ්‍රයන්ගෙන් ද අනාවරණය කරගත හැකි ය.

**නිගමනය**

ත්‍රිපිටක සාහිත්‍යයේ අන්තර්ගත රාජ්‍ය පාලන මූලධර්ම රජරට ශිෂ්ටාචාර අවධියට අයත් පාලකයන් විසින් පාලන ක්‍රියාවලියේ දී භාවිත කළ බවට සාධක ගණනාවක් හතරවන මිහිඳු, පළමුවන විජයබාහු, නිශ්ශංකමල්ල, හා ලීලාවතී රැජින යන පාලක පාලිකාවන් විසින් පිහිටුවා ඇති ශිලා ලේඛන ඇසුරෙන් අනාවරණය කරගත හැකි ය. දුටුගැමුණු, සද්ධාතිස්ස, බුද්ධදාස, කුමාරදාස, මහා පරාක්‍රමබාහු හා දෙවන විජයබාහු යන පාලකයන්ගේ ද පාලනය දශ රාජධර්මයන්ට අනුගත ව ක්‍රියාත්මක වූ බව මහාවංසයේ හා දීපවංසයේ සඳහන් ව ඇත. ලංකාවේ රාජත්වයට පත් වූ පාලකයන් අතුරෙන් අතළොස්සක් හැරුණු කොට අන් සියලු දෙනාම පාහේ තම පාලනය බෞද්ධ ධර්මයට සඅනුගත ව ක්‍රියාත්මක කළ බවක් පෙනෙන්නට තිබේ. තමන්ගේ පාලනය බුදුන්වහන්සේ දේශනා කළ ආකාරයට පවත්වාගෙන යන්නේ යැයි මහජනයාට වඩාත් ඒත්තු ගැන්වීමට ඇතැම් පාලකයන් උත්සුක වූ බවක් පෙනී යන්නේ ඔවුන් විසින් ශිලා ලේඛන මත ඒ බව සටහන් කර තිබීමෙනි. අතීත ශ්‍රී ලාංකේය පාලකයන් බුද්ධ දේශනාවේ අන්තර්ගත පාලන ධර්ම ක්‍රියාවට නංවමින් පුරවැසියා අපේක්ෂිත යහපත් පාලන තන්ත්‍රයක් ගොඩනැඟීමට සමත් වූවා සේ ම නූතන දේශපාලන අධිකාරිත්වයට ද බුද්ධ දේශනාවට අනුගත වෙමින් එම පාලන ධර්මතා මත පදනම් වූ යහපත් පාලන සංවිධානයක් ගොඩනගා ගැනීමට අවකාශ ඇති බව මෙයින් පෙන්වාදිය හැකි ය.

**මුඛ්‍ය පදඃ** ත්‍රිපිටක සාහිත්‍යය, පාලන මූලධර්ම, බුදුදහම, රාජ්‍ය පාලනය, ශිලා ලේඛන

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ඌනපූරණසහිතො මහාවංසො,* (1959). සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*දීඝ නිකාය, 1,2,3.* (1960, 1962, 1973). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, නැදිමාල, සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීපවංසය,* (2016). සංස්. නදීෂා ෂර්මිලී ගුණවර්ධන, කොළඹ, සීරුස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

*මහාවංශය,* ප්‍රථම භාගය, (2014). සි.පරි. ශ්‍රී සුමංගල නාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

*මහාවංශය,* ද්විතීය භාගය, (1996). සි.පරි. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි සහ දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ පඬිතුමා, ගංගොඩවිල, සීමාසහිත 'දීපානි' මුද්‍රණරූ ප්‍රකාශන (පෞද්ගලික) ආයතනය.

*හත්ථවනගල්ලවිහාරවංශය,* (2001). සංස්. ඒ. ඇම්. ඩී. වයි. සරත්චන්ද්‍ර අමරතුංග, කොළඹ, සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම.

*Epigraphia Zeylanica, Vol. I*, (1912). (ed.) D.M.D. Zilva Wickremasinghe, (Asian Educational Services, New Delhi.

*Epigraphia Zeylanica, Vol. II*, (1928). (ed.) D.M.D. Zilva Wickramasingha, (Oxford University press, London.

*Epigarphia Zeylanica, Vol. III,* (1933). (ed.) H.W. Codrington, New Delhi: (Asian Educational Services, New Delhi.

*Epigraphia Zeylanica, Vol. IV*. (1933-1934). (ed). H.W. Codrington and S. Paranavitana, (Asian Educational Services, New Delhi.